සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Pencom

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2025.09.04

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 44 (ඉ) (ii) වගන්තිය යටතේ මනාපය පළ කරමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරින්ගෙන් රජයටට අය විය යුතු මුදල් අය කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් අංක අ.ම.ප/25/1323/818/085 හා 2025 අගෝස්තු මස 12 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් මුල් සේවා කාලය සමඟ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරින් විශ්‍රාම යාමේ දී ඔවුන් ලබාගෙන ඇති සේවක අර්ථසාධක අරමුදලින් 60% ක රාජ්‍ය දායකත්වය නැවත අයකර ගැනීමේ දී එම 60% ක මුදල වෙනුවෙන් එක්වරක් පමණක් වන 4% ක පොලී මුදල නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් හෝ හිඟ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට ඉල්ලා සිටි යෝජනාවට ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව විශ්‍රාම වැටුප් අධයක්ෂ ජනරාල් විසින් යොමු කරන ලද අංක වි.වැ./ම.වි.වැ/පොදු/සමෘද්ධි හා 2025 අගෝස්තු 30 දිනැති ලිපියට අනුව 2023.02.20 දිනට පසු විශ්‍රාමගත්, විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කරන ලද නිලධාරින්ගේ හිඟ විශ්‍රාම වැටුප නොගෙවා රඳවා ගෙන ඇති බව දන්වා ඇති අතර, එම හිඟ වැටුප් ගෙවීම් සඳහා එම නිලධාරින්ගේ / කලත්‍රයන්ගේ සේවක අර්ථ සාධක අරමුදලේ 60% ක් වන රාජ්‍ය දායකත්වය සඳහා එක්වරක් පමණක් අයකල යුතු 4% ක පොලී මුදල නිලධාරියාට / කලත්‍රයාට හිමි හිඟ විශ්‍රාම වැටුපෙන් හා පාරිතෝෂිත මුදලෙන් අයකර ගැනීමට නිලධාරියාගේ / කලත්‍රයාගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක් ලබාගත යුතු බව දන්වා ඇත. මේ පිළිබඳව විශ්‍රාමික නිලධාරින් / කලත්‍රයන් දැනුවත් කර අදාළ කැමැත්ත ප්‍රකාශිත ලිපිය කඩිනමින් ප්‍රධාන කාර්යාලයේ විශ්‍රාම වැටුප් අංශය වෙත යොමුකරන ලෙස දන්වමි.

04. එසේම 2023.02.20 දිනට පසුව විශ්‍රාම ගිය නිලධාරින් වෙනුවෙන්, මෙතෙක් ප්‍රධාන කාර්යාලය වෙත යොමුකරන ලද විශ්‍රාම වැටුප් ලිපි ගොනු හා ඉදිරියේ දී යොමු කරනු ලබන විශ්‍රාම වැටුප් ලිපිගොනු සඳහා ද ඉහත ඡේද අංක 03 හි සඳහන් කැමැත්ත ප්‍රකාශිත ලිපියක් ඇතුලත් කරන ලෙසද දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |